# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1939/30 – 2015 නොවැම්බර් 06 වැනි සිකුරාදා – 2015.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, රජ්ජම්මන (අ. ග. පි. 25 තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/MTL/2014/337 හා 2015.02.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.5059ක් පමණ වන රජ්ජම්මන වතුයාය නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රජ්ජම්මන වතුයාය – ප්‍රමාණය: හෙක්. 0.5059ක් පමණ**

උතුරට: හල්ගහවත්ත වලව්වේ ගුණපාලට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: හල්ගහවත්ත වලව්වේ ගුණපාලට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස මාර්ගය ප්‍රාදේශීය සභා; දකුණට: අංගුලුවේ ගෙදර කරුණාරත්න බණ්ඩාට අයත් රජ්ජම්මන වතුයාය නමැති ඉඩම; බටහිරට: සිංහන ගල්පොත්තේ ඇළ.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2013/WS/474.
2015 ඔක්තෝබර් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැඳුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 616